# සාමාන්‍ය සමයේ දසතුන්වන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 21: 5, 8-20

"දාසියගේ පුත්‍රයා ඊසාක් සමඟ උරුමකරු නොවිය යුතුය."

ඊසාක් උපදින විට ආබ්‍රහම්ට වයස අවුරුදු එක සියයකි. දරුවා වැඩී කිරි වැරුවේය. කිරි වැරූ දිනයෙහි ආබ්‍රහම් මංගල්‍යයක් පැවැත්විය.

ආබ්‍රහම්ට දාව මිසර ජාතික හාගර්ගෙන් ලැබූ ඉෂ්මායෙල් තම පුත්‍රයා වන ඊසාක්ට සරදම් කරනු එක් දිනක් සාරා දුටුවාය. එබැවින් ඈ ආබ්‍රහම්ට කතා කොට, "මේ දාසියත් ඇගේ පුතාත් එළවා දමන්න. මේ දාසියගේ පුතු මාගේ පුත්‍රයා සමඟ උරුමකරු නොවිය යුතුය"යි කීවාය. ඉෂ්මායෙල් ඔහුගේ පුත්‍රයා වන බැවින් මේ ඉල්ලීම නිසා ආබ්‍රහම් දැඩි සිත් වේදනාවට පත් විය. එහෙත් දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට කතා කොට, "නුඹ හාගර් හා ඉෂ්මායෙල් නිසා කණගාටු නොවන්න. සාරා නුඹට කී සියල්ලට ම සවන් දෙන්න. ඒ මන්ද නුඹේ පෙළපත ඇති වන්නේ ඊසාක් මගින් ය. හාගර් ගේ පුත්‍රයා ද නුඹට දාව උපන් බැවින් ඔහුට ද මම පෙළපතක් දෙන්නෙමි"යි වදාළ සේක.

පසුදින උදේ පාන්දරින් ආබ්‍රහම් නැගිට රොටී ද වතුර බෝතලයක් ද ගෙන හාගර්ට දී, දරුවා ඇගේ කරේ තබා ඈ යන්නට හැරියේය. ඈ නික්ම ගොස් බෙයර්ෂෙබා නම් පාළුකරයේ මංමුළා වී ඇවිද්දා ය. බෝතලයේ වතුර ඉවර වූ පසු ඈ පඳුරක් යට දරුවා තබා හී සැරයක් පමණ දුර

ගොස් වාඩි වූවා ය. "දරුවා මැරෙනවා මා බලා ඉන්නේ කොහොමදැ"යි කියමින් ඇ ගොස් ඈතින් හිඳ ගත්තාය. දරුවා ද කෑ ගසමින් හැඬුවේ ය.

දරුවාගේ හඬ දෙවියන් වහන්සේට ඇසිණි. උන් වහන්සේගේ දූතයා ස්වර්ගයේ සිට හාගර්ට කතා කොට, "ඔබ කරදර වී ඉන්නේ කුමක් නිසා ද? බිය නොවන්න. දරුවාගේ හැඬීම දෙවියන් වහන්සේට ඇසී ඇත. නැඟිටින්න, දරුවා ඔසවා අතට ගන්න. මම ඔහුගෙන් විශාල පෙළපතක් ඇති කරමි"යි කීවේය. දෙවියන් වහන්සේ ඇගේ නෙත් පැහැදූ විට ඇ වතුර ඇති ළිඳක් දුටුවාය. ඇ ද ගොස් භාජනය පුරවා දරුවාට බීමට උ න්නාය. දෙවියන් වහන්සේ ද ඒ දරුවා සමඟ වූ සේක. ඔහු වැඩී පාළුකරයේ පදිංචි වී දුනුවායෙක් විය.

දේව වාක්‍යය එසේය.

| පිළිතුරු ගීය |
| --- |

ගීතාවලිය **50: 16–23**

පිළිතුර: සමිඳුනි, අපගේ කන්නලව්වට සවන් දුන මැනව.

ගීය:

හිමිතුමන්ට කන්නලව් කළ එක් අසරණයෙක් විය.
එතුමාණෝ ඔහුගේ බස් අසා, සියලු දුක් ගැහැටවලින් ඔහු මිදූ සේක.
හිමිතුමන්ගේ දූතයා දේව බය ඇති අය වටකර, කඳවුරු බැඳ ඔවුන් මුදා හරියි.

එතුමන්ගේ සැදැහැවතුනි, එතුමන්ට ගරු බිය දක්වන්න. මන්ද, දේව ගරු බිය ඇති අයට අග හිඟයක් නැත.
ධනපතීහු පවා කෑම නැතිව සාගින්නෙන් පෙළෙති. එහෙත් හිමිතුමන් සරණ යන අයට යහපත් දෙයින් කිසි අඩුවක් නැත.

දරුවෙනි, මට සවන් දෙන්න. සමිඳුන්ට ගරු කිරීමට මම ඔබට උගන්වන්නෙමි. සැප ජීවිතය භුක්ති විඳීමට යම් කෙනෙක් කැමැති ද? දීඝායු වළඳා සුව සම්පත් රස විඳීමට කැමැති ද?

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි. මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නේ ය"යි
සමිඳාණෝ වදාරන සේක.

ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේ මැවූ සත්ත්වයන් අතර අප මුදුන් මල්කඩ වීමේ පෙර ලකුණු වශයෙන්
ස්වකීය අරමුණු අනුව උන්වහන්සේ සත්‍ය වචනයෙන් අප ජනිත කළ සේක.

ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 8: 28–34

“නියමිත මොහොතට පළමුවෙන් අපට වද දෙන පිණිස මෙහි ආ සේක් ද?”

ජේසුස් වහන්සේ මුහුදෙන් එගොඩව, ගදරීන රටට පැමිණි කල, යක්ෂාවේශ වූ දෙදෙනෙක් සොහොන් ගෙවලින් නික්ම විත් උන්වහන්සේට මුණ ගැසුණාහ. ඔවුන් ඉතා දරුණු වූයෙන් ඒ පාරෙන් කිසිවෙකුට යන්න නොහැකි විය.

ඔව්හු මොර ගසමින්, “දෙවියන්වහන්සේගේ පුත්‍රය, ඔබ හා අප අතර මොන ගණුදෙනුවක් ද? නියමිත මොහොතට පළමුවෙන් අපට වද දෙන පිණිස මෙහි ආ සේක් දැ”යි කීහ.

ඈතින් මහා ඌරු රැළක් ගොදුරු කමින් සිටියහ. යක්ෂයෝ කතා කරමින්, “ඔබ අප දුරු කරන සේක් නම්, ඌරු රැළට වැහෙන්නට අප හැරිය මැනැවැ”යි උන්වහන්සේගෙන් අයැද සිටියහ. “පලයව්” කියා උන්වහන්සේ ඔවුන්ට අණ කළ සේක. එවිට යක්ෂයෝ පිටවී ගොස් ඌරන්ට වැහුණෝ ය. ඒ මුළු රැළ ප්‍රපාතයෙන් පහළ මුහුදට දිව ගොස් ජලයේ ගිලී මළෝ ය. ඌරු ගොවුවෝ පලා ගොස් නුවරට පැමිණ ඒ සියල්ල ද යක්ෂාවේශ වූවන්ට සිදුවූ දේ ද පැවසූහ. එකල ඒ මුළු නුවර වැසියෝ ජේසුස් වහන්සේ හමුවීමට අවුත්, උන්වහන්සේ දැක තමන්ගේ පළාතෙන් පිටවී යන ලෙස උන්වහන්සේගෙන් බැගෑපත්ව ඉල්ලා සිටියහ.

සුවිශේෂ වාක්‍යය එසේය.